සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2024 ජනවාරි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2024-02-10
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, පොදු නීතියක් වශයෙන් සළකනු ලබන්නේ කුමක් ද?

(1) මුස්ලිම් නීතිය. (2) උඩරට නීතිය.
(3) තේසවලාමේ නීතිය. (4) ඉංග්‍රීසි නීතිය.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, සෝදිසි වරෙන්තු හා පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමේ වරෙන්තු නිකුත් කිරීමේ අධිකරණ බලය හිමි වන්නේ කුමන අධිකරණයට ද?

(1) ශ්‍රේෂ්ඨාධිකරණය. (2) පවුල් අධිකරණය.
(3) මහේස්ත්‍රාත් අධිකරණය. (4) අභියාචනාධිකරණය.

1.3 ගිවිසුම් නීතිය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ ඔබ වෙත ලබාදී ඇත:

(a) නීතියෙන් බලාත්මක කළ හැකි වන්නේ ලිඛිත ගිවිසුම් පමණි.

(b) පාර්ශවකරුවන්ගේ ව්‍යංග හැසිරීම මගින් ගිවිසුමක් ඇති කිරීමට පුළුවනි.

(c) ඇතැම් ප්‍රඥාප්ති මගින් පනවා ඇති අවශ්‍යතාවයන්ට සහ නියමයන්ට අනුකූල වීම පිණිස ඇතැම් ගිවිසුම් ලිඛිතව සිදුකළ යුතුය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ගිවිසුම් නීතිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ තෝරන්න:

(1) **(a)** පමණි. (2) **(c)** පමණි.

(3) **(a)** සහ **(b)** පමණි. (4) **(b)** සහ **(c)** පමණි.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, සමාගමක, සාංගමික ව්‍යවස්ථාවලිය සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) සාංගමික ව්‍යවස්ථාවලිය තුළ සමාගමේ කොටස්හිමියන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් ඇතුළත් වේ.

(2) සමාගමකට, සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කළ නොහැක.

(3) සමාගම සහ කොටස්හිමියන් යන දෙපාර්ශවයම සාංගමික ව්‍යවස්ථාවලියට බැඳී සිටී.

(4) සාංගමික ව්‍යවස්ථාවලිය තුළ සමාගමේ අරමුණු ඇතුළත් වේ.

1.5 මිල, රක්ෂණය සහ ගැල්කුලී (CIF) ගිවිසුමක් සම්බන්ධ පහත සඳහන් වගකීම් සළකා බලන්න:

(a) ගිවිසුමේ විස්තර කර ඇති ප්‍රමිතියෙන් භාණ්ඩ නැවට පැටවීම.

(b) රක්ෂණ ගිවිසුමක් පිළියෙල කිරීම.

(c) භාණ්ඩ සඳහා ඉන්වොයිසියක් පිළියෙල කිරීම.

(d) අදාල ලියකියවිලි ලැබුණු පසු ඉන්වොයිසියට අදාල ගෙවීම් පියවීම.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, විකුණුම්කරුගේ වගකීම් වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a), (b)** සහ **(c)** පමණි.

(3) **(a), (c)** සහ **(d)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, 1927 අංක 25 දරණ විනිමය බිල්පත් ආඥා පනත මගින් හඳුනාගෙන ඇති ගනුදෙනු කළහැකි ලියවිල්ලක් **නොවන්නේ** කුමක් ද?

(1) චෙක්පත්. (2) මුදල් ඇණවුම්.

(3) පොරොන්දු නෝට්ටු. (4) විනිමය බිල්පත්.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක 1.7 සිට 1.9 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍ය**දැයි දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.7 පුද්ගලයින් දෙදෙනෙක් හෝ වැඩි ගණනක් එකතු වී, ලාභ බෙදාගැනීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි නම්, "හවුල් ව්‍යාපාරයක්" ස්ථාපිත කළ හැකිය.

1.8 අන්තර්ජාතික වෙළෙඳ ගිවිසුම් පිළිබඳ ඒකීය පරිචය (INCOTERMS) යනු ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම්වල ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන්ගේ වගකීම් නිර්වචනය කරනු ලබන ප්‍රමිතිගත නීති මාලාවකි.

1.9 විනිමය බිල්පතක් රේඛණය කළ හැකි වේ. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක 1.10 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.10 ගිවිසුම් නීතිය යටතේ ගිවිසුම් කොන්දේසියක් කඩ වූ විට, අහිංසක පාර්ශවයට ඇති ප්‍රතිකර්ම දෙකක්(02) සඳහන් කරන්න.

1.11 "සිවිල් නීතිය" සහ "අපරාධ නීතිය" අතර ඇති වෙනසකම් දෙකක්(02) සඳහන් කරන්න.

1.12 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ අරමුණක් සඳහන් කරන්න.

1.13 හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීමට අධිකරණයට නියෝග කළ හැකි අවස්ථා දෙකක්(02) සඳහන් කරන්න.

1.14 ජාත්‍යන්තර වෙළෙඳ ආරවුල් විසඳීමේදී භාවිත කරන අධිකරණ නොවන (non-judicial) ආරවුල් විසඳීමේ ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න. (එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

**ගිහිගේ** 2023 ජනවාරි මාසයේදී ඔහුගේ නිවස **සීමාසහිත ABC ඉන්ෂුවරන්ස් සමාගමේ** රක්ෂණය කරන ලදි. ජූලි මාසයේදී ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීම සඳහා 2023 මාර්තු මාසයේදී ඔහු විසින් නිවස විකිණීමට තීරණය කරන ලදි. **සල්වතුර** විසින් නිවස මිලදී ගැනීමට එකඟ විය. 2023 අප්‍රේල් 05 දින, **සල්වතුර** සම්පූර්ණ මිල ගෙවා නිවස මිලට ගත් අතර, 2023 අප්‍රෙල් මාසය අවසානයේදී නව නිවසේ පදිංචි වීමට තීරණය කර ඇත. නමුත් 2023 අප්‍රේල් 10 දින ගින්නකින් නිවසට හානි විය. **සීමාසහිත ABC ඉන්ෂුවරන්ස් සමාගම,** ඇතිවූ අලාභය **ගිහිගේ** ට ගෙවා දමන ලදි. පසුව, **සීමාසහිත ABC ඉන්ෂුවරන්ස් සමාගමට** එම නිවස වෙනත් පාර්ශවයකට විකුණා ඇති බව දැනගන්නට ලැබී ඇත. එබැවින්, රක්ෂණ ඔප්පුව යටතේ කළ වන්දි ගෙවීම නැවත අයකර ගැනීමට ඔවුන් තීරණයකොට ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත ABC ඉන්ෂුවරන්ස් සමාගමට රක්ෂණ ඔප්පුව යටතේ කළ වන්දි ගෙවීම, නැවත ලබාගත හැකිද යන්න පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **රක්ෂණයේ "දායකත්ව මූලධර්මය" පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

සාම්ප්‍රදායික බතික් ඇඟළුම් අලෙවිකරන බතික් සාප්පුවක් **භක්ති** සතුව ඇත. ඩුබායි හි පැවැත්වෙන ජාත්‍යන්තර බතික් සමුළුවකට ඇයට සහභාගි වීමට සිදුවූ නිසා ඇය තම හොඳම මිතුරිය වූ **අවංකා** ට තම අලෙවිසැල පවත්වාගෙන යාමට පවරන ලදී. අලෙවිසැලේ ප්‍රදර්ශනයට තබා ඇති කිසිදු ඇඟළුමක් එහි ප්‍රදර්ශනය කර ඇති මිලෙන් 75% කට වඩා අඩුවෙන් අලෙවි කළ නොහැකි බවට **භක්ති** විසින් **අවංකා** ට උපදෙස් ලබාදෙන ලදී. තවද, ඇය විසින් **අවංකා** ට උපදෙස් ලබාදෙන ලද්දේ කවර තත්ත්වයක් යටතේ වුවද අලෙවිසැල සඳහා කිසිදු තොගයක් මිලට ගත නොහැකි බවය.

**භක්ති** ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටියදී, **අවංකා** විසින් සාරි 50 ක පාර්සලයක් **සීමාසහිත සළුසල සමාගම** ට ප්‍රදර්ශනය කරන ලද මිලෙන් 70% කට අලෙවි කරන ලදී. බලාපොරොත්තු වූවාට වඩා ඉක්මනින් සරම් තොගය අවසන් වූ නිසා, **අවංකා** විසින් දේශීය සැපයුම්කරුවෙකුගෙන් බතික් සරම් 100 ක් මිලට ගන්නා ලදී. මෙම ගනුදෙනුවලින් තමන්ට පාඩුවක් සිදුවූ බව **භක්තිගේ** අදහසයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ප්‍රධානියා-නියෝජිතයා අතර සම්බන්ධතාවයක් ඇතිවිය හැකි ආකාර දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) **භක්තිගේ** නියෝජිතයා ලෙස **අවංකාගේ** යුතුකම් **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) **භක්ති** ට සිදුවූ හානිය **අවංකාගෙන්** අයකරගත හැකිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

2023 මාර්තු මාසයේදී, ශ්‍රී ලංකා රජය සහල් ඇතුළුව අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා මිල පාලනයක් පැනවූයේ පුරවැසියන්ට සහල් මිල දැරිය හැකි මට්ටමක පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා ය. **සඳුන්, සඳුන් ස්ටෝර්ස්** හි අත්‍යවශ්‍ය සිල්ලර බඩු අලෙවි කරනු ලබන අතර, **මයුර** එහි නිත්‍ය පාරිභෝගිකයෙකු වේ. කෙසේවුවද, **මයුර** සහල් මිලදී ගැනීමට **සඳුන් ස්ටෝර්ස්** වෙත ඇතුළු ව විට සහල් තබා ඇති රාක්ක සියල්ලම හිස් බව **මයුර** ට අවබෝධ විය. **මයුර** මේ පිළිබඳව **සඳුන්ගෙන්** ඉවසීමෙන් යුතුව විමසීමේදී **සඳුන්** පවසා සිටියේ සහල් සැපයුම් දාමයෙහි යම් ගැටළු කිපයක් පවතින බවත්, සහල් බෙදාහැරීමේ කටයුතුවල ප්‍රමාදයක් පවතින බවත් ය. **මයුර** වෙළෙඳසැලෙන් පිටව යන විට **සඳුන් ස්ටෝර්ස්** හි සහල් ගබඩාව පිළිබඳව පුද්ගලයින් කිප දෙනෙකු මුමුනන අයුරුත් සහල් ගබඩාව අනෙක් වෙළෙඳසැල්වලට බලපෑ නැති බවත් දක්නට ලැබුණි. නැවතත් **මයුර, සඳුන් ස්ටෝර්ස්** වෙත ගොස් වෙනත් අලෙවි සැල්වල සහල් ඇති බවට පැවසූ අතර, **සඳුන්** ඔහුට තම වෙළෙඳසැලෙන් වහාම ඉවත්ව යන ලෙස පවසන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පාරිභෝගික කටයුතු අධිකාරියේ අරමුණු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) ඉහත සංසිද්ධියේදී **මයුරගේ** නෛතික අයිතිවාසිකම් **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(a) "වෙන්වූ නෛතික පුද්ගලභාවය යනු නීතිය ඉදිරියේ සංස්ථාවක් හෝ සමාගමක් එහි හිමිකරුවන් හෝ කොටස්කරුවන්ගෙන් වෙන්ව පවතින විශේෂ නීතිමය අනන්‍යතාවය වේ".

**ඔබ විසින් කළ යුතු දෑ:**

සංස්ථාපිත කඩතුරාව ඉවත් කරනු ලබන (veil is lifted) අවස්ථා හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(b) **තඳුන්** විසින් හිස් චෙක්පතක් අත්සන් කොට *"ගණුදෙනු කළ නොහැක"* යන වචන යොදා එය රේඛණය කරන ලදී. ඔහු තම සහයකාව වන **සුමුදු** ට චෙක්පත ලබාදී එහි මුදල සඳහන් කොට ඔහුගේ ව්‍යාපාරයේ ජල බිල්පත ගෙවන ලෙස ඇයගෙන් ඉල්ලා සිටින ලදී. කෙසේවුවද, **සුමුදු** විසින් චෙක්පතේ විස්තර සම්පූර්ණ කොට ඇය **මතීශාගෙන්** ලබාගත් ණය මුදලක් පියවීම සඳහා චෙක්පත **මතීශා** ට ලබාදෙන ලදී. **මතීශා** චෙක්පත බැංකුවට ඉදිරිපත් කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත චෙක්පත සම්බන්ධයෙන් බැංකුවට ඇති වගකීම **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

**(මුළු ලකුණු 10)**

## **06** වන ප්‍රශ්නය

**මදූෂා** ග්‍රැෆික් නිර්මාණ ශිල්පිනියක් වූ අතර, Content.lk ආයතනය ඔවුන් විසින් බාරගෙන ඇති ව්‍යාපෘතියක් සම්පූර්ණ කිරීම සඳහා ඇයව බඳවා ගන්නා ලදී. **මදූෂා,** මෙම ආයතනයේ හිමිකරුගේ ඥාතියෙකු වූ බැවින්, ඇය කිසිදු ගිවිසුමක් අත්සන් කරනු නොලැබුණි. ව්‍යාපෘතියට අදාල සමාජ මාධ්‍ය අලෙවිකරණ කටයුතු හසුරුවන ලෙස ඇයගෙන් ඉල්ලා සිටින ලදී. කෙසේවුවද, මෙම ව්‍යාපෘතියේ කාලසීමාව පිළිබඳව ඇයව දැනුවත් කිරීමක් කර නොතිබුණි. **මදූෂා** දිනපතා කාර්යාලයට නොයන ලදී. ඇය නිවසේ සිට වැඩකළ අතර, ඇයගේ මුදලින් මිලදී ගත් ලැප්ටොප් පරිගණකයක් සහ ග්‍රැෆික් නිර්මානකරණ මෘදුකාංගයක් මේ සඳහා භාවිත කරන ලදී. ඇය සෑම විටම දී ඇති ඉලක්ක කාලසීමාවන් සපුරාලීම සඳහා කටයුතු කරන ලදී.

මාස කිපයකට පසව, Content.lk හට ඔවුන්ගේ ව්‍යාපාරය සඳහා නව ලාංඡනයක් නිර්මාණය කිරීමට අවශ්‍ය විය. මේ බව **මදූෂාට** දැනුම් දුන් විට **මදූෂා** මෙම ලාංඡනය නිර්මාණය කිරීම සඳහා නව මෘදුකාංගයක් මිලට ගැනීමට අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව, ඇය තම වෘත්තීය ගාස්තුව සහ මෘදුකාංගයට අවශ්‍ය මිල සඳහන් කරමින් හිමිකරු වෙත ඉන්වොයිසියක් යොමුකර ඇත. **මදූෂාගේ** වෘත්තීය ගාස්තුව, වෙළෙඳපොළ මිලට වඩා වැඩි බව හිමිකරුට අවබෝධ විය. එමනිසා, **මදූෂාගේ** ගාස්තුව අඩුකරන ලෙස ඔහු විසින් ඉල්ලා සිටින ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **මදූෂා,** Content.lk ආයතනයේ සේවකයෙක්ද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) සේවකයෙකු හට සේවක අර්ථසාධක අරමුදලේ [Employees' Provident Fund (EPF)] ප්‍රතිලාභ ලබාගත හැකි අවස්ථා හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

**(මුළු ලකුණු 10)**

*B කොටසෙහි අවසානය*

# <u>C කොටස</u>

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

(A) සුප්‍රසිද්ධ රේසිං මෝටර් රථ රියැදුරෙකු වන **ඩීල් මහතා**, ඔහුගේ පාවිච්චි කරන ලද සුබෝපභෝගී රේසිං මෝටර් රථය, *"1976 Model C, Black Colour - for sale"* යනුවෙන් විකිණීම සඳහා ප්‍රචාරය කරන ලදී. රේසිං කාර් රියැදුරෙකු සහ දැඩි මෝටර් රථ රසිකයෙකු වන **කීල්ස් මහතා** කිසිඳු වට්ටමක් හෝ මිල අඩුකිරීමක් ඉල්ලා නොසිට **ඩීල් මහතා** සඳහන් කළ මිලට එය මිලදී ගන්නා ලදී.

**කීල්ස් මහතා** 2022 ඔක්තෝම්බර් මාසයේදී ප්‍රංශයේ පැවති "ලෝක රේසිං කාර් තරඟයට" සහභාගී විය. මෙහිදී ඔහු **ඩීල් මහතාගෙන** මිලට ගත් රථය පදවන ලදී. තරඟය පැවැත්වෙන අතරතුර, මෙම මෝටර් රථය අතරමගදී නතර විය. පසුව, **ඩීල් මහතාගෙන්** මිලට ගත් මෙම මෝටර් රථය 1967 මාදිලියේ වාහනයක් බව **කීල්ස් මහතා** සොයාගන්නා ලදී. **කීල්ස් මහතා** විසින් **ඩීල් මහතාගෙන්** මෝටර් රථය සඳහා ගෙවන ලද මුදල් ආපසු ලබාගැනීමට අපේක්ෂා කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ඇති ව්‍යංග කොන්දේසි (implied conditions) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) "විකුණුම් ගිවිසුමක්" සහ "විකිණීමට එකඟවීමක්" අතර ඇති වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(c) **කීල්ස් මහතාට, ඩීල් මහතාගෙන්** මුදල් ආපසු ලබාගත හැකිද **යන්න** පැහැදිලි **කරන්න**. (ලකුණු 07)

(B) 17 හැවිරිදි වියේ පසුවන **නයනි**, දක්ෂ පියානෝ වාදන ශිල්පිනියකි. දේශීය සංගීත ඇකඩමියක් වන **ශාන්ති ඇකඩමිය** ඇයගේ දක්ෂතා හඳුනාගෙන ඉදිරි වසර සඳහා උසස් මට්ටමේ පියානෝ පාඩම් හැදෑරීම සඳහා ඇය වෙත ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී. මේ වෙනුවෙන් **නයනි** විසින් පාසැල් උත්සව කීපයක් සඳහා ප්‍රසංග ඉදිරිපත් කිරීම අවශ්‍ය විය. කෙසේවුවද, මාස කීපයක අධ්‍යයන කටයුතුවලින් පසුව, **නයනි** විසින් ඇකඩමියට සම්බන්ධ නොවීමට තරණය කරන ලදී. ඇය අධ්‍යයන කටයුතුවලටත් ප්‍රසංග කටයුතුවලට සහභාගීවීමත් නවතා දමන ලදී. මෙම ගිවිසුම මඟින් **නයනි** ට වාසිදායක වූ බව පවසන සංගීත ඇකඩමිය දැනටමත් සහභාගී වූ අධ්‍යයන කටයුතු සඳහා මුදල් ගෙවන මෙන් ඉල්ලා සිටී. **නයනි** ගිවිසුමකට බැඳී නොමැති බවට **නයනිගේ** දෙමව්පියන් තර්ක කරනු ලබති.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත ගිවිසුම මඟින් **නයනි** බැඳී සිටින්නේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) මුක්ත වගන්ති (exemption clauses) වලංගු නොවන බවට විශ්වාස කරනු ලබන අවස්ථා දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |